# විප්ලව කරන්නේ කවු ද?

ඕනෑම ප්‍රවාදයක් යනු අවසාන වශයෙන් ගත්කල ප්‍රශ්නයකට දෙන පිළිතුරක් වෙයි. අප බොහෝ විට ප්‍රවාද වශයෙන් සලකන්නේ සාධාරණ (general) ප්‍රශ්නවලට දෙන පිළිතුරු ය. ඒ ප්‍රශ්න හා පිළිතුරු වියුක්ත වශයෙන් ඉදිරිපත්කිරීම නොයෙක්විට බටහිර විද්‍යාවෙහි සිදුවෙයි. මෙහි දී අපට පිළිතුරු දීමට සිදු වී තිබෙන ප්‍රශ්නය නම් මනස යනු කුමක් ද යන්න ය. එයට බටහිර භෞතවේදය (Physiology) හැදෑරූ ඇතැම් මහාචාර්යවරු දෙන පිළිතුර නම් මනසක් යනුවෙන් යමක් නොපවතීය යන්න ය. භෞතවේදයේ හැදෑරෙන්නේ ඉන්ද්‍රිය ගෝචර අවයව ය. හදවත, මොළය, පෙනහැල්ල ආදිය භෞතවේදය හදාරන්නන්ට හමුවෙන අවයව වෙයි. එහෙත් ඔවුන්ට මනස නමින් අවයවයක් සිරුරෙහි දැකගැනීමට නො හැකි ය. භෞතවේදය යනු බටහිර විද්‍යාවේ එතරම් වියුක්ත ක්ෂෙත්‍රයක් නො වෙයි. භෞතවේදය පිළිබඳ මහාචාර්යවරු ද පාසලේ දී භෞතික විද්‍යාව හදාරන අවස්ථාවේ දී ගුරුත්වාකර්ෂණය හදාරා ඇති නමුත් ඒ ඉන්ද්‍රිය ගෝචර නොවන බව නොදනිති. ඔවුන් ඇතැම්විට සිතනු ඇත්තේ ගුරුත්වාකර්ෂනය ඉන්ද්‍රිය ගෝචර සංසිද්ධියක් බව ය.

මනසක් නැතැයි යනුවෙන් පවසන්නෝ අවසාන වශයෙන් ගත්කල නියතිවාදියෝ වෙති. ඔවුන් නිව්ටෝනීය වර්ගයේ දැඩි නියතිවාදීන් යැයි මෙයින් නො කියැවෙයි. (දැඩි නියතිවාදයට අනුව පද්ධතියක ආරම්භක අවශ්‍යතා දුන් පසු ඕනෑම කාලයක දී පද්ධතියෙහි පිහිටීම හා ගම්‍යතාව නිසැකව ප්‍රකාශකළ හැකි ය.) එහෙත් ඔවුහු යම් ආකාරයකට හෝ නියතිවාදීහු වෙති. ක්වොන්ටම් භෞතිකය නිව්ටෝනීය භෞතිකය මෙන් නියතිවාදයක් නො වෙයි. එහි දී පද්ධතියකට යම් කාලයකට පසු කිනම් පිහිටුමක් තිබේ ද, කිනම් ගම්‍යතාවක් තිබේ ද ආදිය ගැන නිශ්චිත ව යමක් කිවහැකි නො වෙයි. එහි දී කළ හැක්කේ පද්ධතියට අසවල් පිහිටුම තිබීමට අසවල් සම්භාවිතාවක් ඇතැයි කීම පමණකි. එසේත් නැත්නම් අසවල් ගම්‍යතාව තිබීමට අසවල් සම්භාවිතාව ඇතැයි කීම පමණකි.

එසේ ද වුවත් ඒ සම්භාවිතාවන් ගැන අපි කලින් දනිමු. ඒ සම්භාවිතාවන් වෙනස්කිරීමට ක්වොන්ටම් අංශුවට හෝ පද්ධතියට හෝ නො හැකි ය. ක්වොන්ටම් පද්ධතිය අගයන් කිහිපයකින් එක් අගයක් පමණක් ගනියි. ඒ අගය ගැනීම ක්වොන්ටම් පද්ධතිය දැනුවත් ව කරන දෙයක් නො වෙයි. ක්වොන්ටම් පද්ධතියට අවශ්‍ය නම් ගැනීමට ගිය අගය වෙනස්කිරීමට නො හැකි ය. ඒ ආකාරයෙන් ගත් විට ක්වොන්ටම් භෞතිකයෙහි ද නිව්ටෝනීය භෞතිකයෙහි තරමට නැතිවුවත් යම් නියතිවාදයක් වෙයි.

එහෙත් මිනිස්සු නිව්ටෝනීය පද්ධති පමණක් නොව ක්වොන්ටම් පද්ධති ද නො වෙති. ක්වොන්ටම් භෞතිකය ආශ්‍රයෙන් පුනර්භවය තේරුම්කිරීමට යෑමම නොමනා කටයුත්තක් වන්නේ එබැවින් ය. මිනිස්සු සිතති. මිනිසුන්ට එක් අවස්ථාවක යම් සිතිවිල්ලක් සිතා ඉන් මොහොතකට පසුව එහි විරුද්ධ සිතිවිල්ල සිතිය හැකි ය. අවශ්‍ය නම් සිතිවිල්ල වෙනස්කළ හැකි ය. මිනිසුන් එසේ කරන්නේ කෙසේ ද? එය මොළයේ සිදුවන ක්‍රියාවක් පමණක් ද? මොළයට මේ මොහොතේ එන සිතිවිල්ලක් ඊළඟ මොහොතේ වෙනස්කරන්නේ කෙසේ ද යන්න තේරුම්කිරීම සඳහා ප්‍රවාදයක් වේ ද? ඒ හෝමෝනවල ප්‍රතිඵලයක් ද? නැත්නම් එදා ගත් ආහාරයේ ප්‍රතිඵලයක් ද?

යමකුට කිවහැක්කේ මේ සම්බන්ධයෙන් අද ප්‍රවාදයක් නැතත් හෙට බටහිර ස්වාමිවරුන්ට පින්සිදුවන්නට ප්‍රවාදයක් නිර්මාණය කළ හැකි ය යන්න ය. එවැනි තර්කයක් වෙනත් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් වුව ද ගෙන ආ හැකි ය යන්න අමතක නොකළ යුතු ය. ශාන්තිකර්මවලින් ලෙඩ රෝග සුවවීම පිළිබඳ ප්‍රවාදයක් අද නැතත් තව වසර කිහිපයකින් එවැනි ප්‍රවාදයක් ඇති වේවියැයි කෙනකුට තර්ක කළ හැකි ය. අද නැතත් හෙට තිබීමට හැකිය යන ආකාරයේ තර්ක ප්‍රබල තර්ක නො වෙයි.

මිනිසුන් සිතන්නේ මොළයේ සිදුවන ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් ලෙස යැයි ගතහොත් එවිට එතැනද ඇත්තේ යම් ආකාරයක නියතිවාදයක් යැයි අපි කීවෙමු. මොළය යනු ද්‍රව්‍යමය දෙයකි. එයට බලපාන්නේ භෞතිකයේ ක්‍රියාකාරකම් ය. භෞතිකයේ (භෞතිකය යනුවෙන් හඳුන්වනු ලබන්නෙහි යැයි කීම යෝග්‍ය වුවත් අපි ඒ ව්‍යවහාරය දිගින් දිගට නො කරමු.) ක්‍රියාකාරීත්වය තේරුම්ගැනීම සඳහා මිනිසුන් විවිධ ප්‍රවාද නිර්මාණය කර ඇත. ඒ සියල්ල යම් ආකාරයකට

© Prof. Nalin De Silva

හෝ නියතිවාදී ඒවා වෙයි. එබැවින් සිතන්නේ මොළයේ ක්‍රියාකාරකම් නිසා පමණක් යැයි ගැනීම අවසාන වශයෙන් ගත්කල නියතිවාදී වෙයි. ඒ නියතිවාදයේ තවත් ප්‍රතිඵල වෙයි. ඒ ප්‍රතිඵල බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි වුව ද ප්‍රශ්න ඇති කරයි.

සිතන්නේ මොළයෙන් හෝ මොළය ආශ්‍රයෙන් ය යන උපකල්පනයත් සමග අපේ ක්‍රියාවලට වගකිවයුත්තේ අපේ මොළය යන නිගමනයට බැසීමට අපට සිදුවෙයි. දෙවියන් වහන්සේ ඒ ඒ මිනිසා මවා ඇත්තේ ඒ ඒ මොළය සමග බැවින් අවසානයේ දී අපේ සියළු කාර්ය සම්බන්ධයෙන් වගකිව යුත්තේ දෙවියන් වහන්සේ ය. මෙය අපේ සියළු ක්‍රියාකාරකම්වල වගකීම හෝමෝනවලට භාරදීමට වඩා වෙනස් නො වෙයි. හෝමෝන පිළිබඳව අපට වගකීමක් නොමැති බැවින් එහි දී මෙන් ම මෙහි දී ද අපේ සියළු ක්‍රියාකාරකම්වල වගකීම දෙවියන් වහන්සේට පැවරෙයි.

අපි හෝමෝන සම්බන්ධව කලින් සාකච්ඡාකර ඇත්තෙමු. මොළය සම්බන්ධ කරුණුවලදී ද එහි දී දක්වන ලද කරුණු අදාළ වෙයි. අපට ස්වර්ගයට යෑමට අවශ්‍ය නම් අපට කළ හැකි දෙයක් තිබේ ද? අපේ සිතිවිලි පාලනය කෙරෙන්නේ මොළයෙන් නම් මොළය දෙවියන් වහන්සේගේ කැමැත්ත පරිදි මවනු ලැබ ඇත්නම් මොළය ක්‍රියාකරන්නේ අපට අවශ්‍ය ආකාරයකට නොවේ නම් අපට ස්වර්ගයට යෑමට වුවමනාවක් ඇතිවීමට ඉඩක් නැත. සියල්ල කලින් ම තීරණය වී ඇති බැවින් අපට කරන්නට දෙයක් නැතිවා පමණක් නොව කරන්නට හැකියාවක් ද නැත. සියල්ල සිදුවන්නේ මොළයට අවශ්‍ය ආකාරයට ය.

මෙය තවදුරටත් වර්ධනය කළ විට පෙනී යන කරුණ නම් අපට දෙවියන් වහන්සේ ගැන විශ්වාසයක් ඇතිකර ගැනීමට ද හැකි කමක් නැති බව ය. දෙවියන් වහන්සේ ගැන විශ්වාසයක් ඇති වන්නේ හෝ නොවන්නේ හෝ මොළය නිර්මාණය වී ඇති ආකාරයට බැවින් හා මොළය අවසාන වශයෙන් ගත් කළ දෙවියන් වහන්සේගේ නිර්මාණයක් වන බැවින් අප කිසිවකු දෙවියන් වහන්සේ ගැන විශ්වාසයක් තබන්නේ දෙවියන් වහන්සේට අවශ්‍ය නිසා ය. එවිට ඉන් ලැබෙන නිගමනය නම් දෙවියන් වහන්සේ ඇතැම් පිරිසක් තමන් වහන්සේ ගැන විශ්වාසයක් ඇති වන ලෙස නිර්මාණය කර ඒ අය ස්වර්ගයට ගන්නා බවත් තවත් පිරිසක් තමන් වහන්සේ ගැන විශ්වාසයක් ඇති නොවන අයුරින් නිර්මාණය කර ඔවුන් අපායට යවන බවත් ය. මෙවැනි නිගමනයකට ඒමට ඉඩ සැළැස්වීම දෙවියන් වහන්සේට වුව ද යහපත් නො වෙයි.

ඉහත උපකල්පනය දෙවියන් වහන්සේ ගැන විශ්වාසයක් නොමැති භෞතවේදය පිළිබඳ මහාචාර්යවරයකු බටහිරයකු අතින් ලියැවී ඇති ලිපියක හෝ පොතක හෝ සඳහන් වුවක් අනුකරනය කරමින් ප්‍රකාශකරන්නක් විය හැකි ය. ඒ කෙසේ වෙතත් මනසක් නැතැයි කියමින් සිතිවිලි පහළ වීම මොළයට පමණක් භාරදීම මොළය ඇති වැඩක් නො වෙයි. එහි දී ස්වඡන්දය හෙවත් තම කැමැත්ත යන සංකල්පය නැති වී යයි. ද්‍රව්‍යවාදය අවසාන වශයෙන් නවතින්නේ ස්වඡන්දය නැති කරගනිමින් ය. මාක්ස්වාදීහු ලෝකය වෙනස්කිරීමට දේශපාලන සංවිධාන තනාගනිති. එහෙත් මිනිසුන් සිතන්නේ මොළයට අවශ්‍ය අන්දමට නම් ඉන් කියැවෙන්නේ ඒ ඒ පුද්ගලයන් එකතු වී පක්ෂ නිර්මාණය කරගන්නේ ඒ ඒ අයට අවශ්‍ය නිසා නොව ඒ ඒ අයගේ මොළය ඒ ඒ ආකාරයට නිර්මාණය වී ඇති නිසා බව ය.

පුද්ගලයන්ට සිතන්නට එවැනි නිදහසක් නොමැති නම් පුද්ගලයන්ගෙන් සමන්විත පංතියකට එවැනි කැමැත්තක් ඇතිකරගත හැකි ද? එනම් පංතියකට සමාජ ක්‍රමයක් වෙනස්කළ යුතු ය යන හැඟීමක් ඇති කර ගත හැකි ද? පංතියකට එවැනි අවශ්‍යතාවක් ඇති විය හැක්කේ සිතන පතන පුද්ගලයන්ගේ එකතුවක් ලෙස නොවේ යැයි අපට මෙහි දී නිගමනයකිරීමට සිදුවෙයි. පංතිය ඊනියා ඓතිහාසික අවශ්‍යතාවක් ලෙස එවැනි වුවමනාවක් ඇතිකරගන්නවා විය හැකි ය. ද්‍රව්‍යවාදීන්ට තර්කයට ඉඩක් දීම සඳහා ඒ කරුණ පිළිගන්නේ යැයි සිතමු. එනම් ඓතිහාසික අවශ්‍යතා හේතුකොටගෙන පංතියකට එවැනි වුවමනාවක් ඇතිවෙයි. එහෙත් ඉන්පසු ප්‍රශ්නය වනුයේ ඒ පංතියේ සාමාජික ඒ ඒ පුද්ගලයා එවැනි අදහසක් ඇතිකරගන්නේ කෙසේ ද යන්න ය. එමෙන් ම පංතියේ අවිය වූ පක්ෂය නිර්මාණයකරන්නේ කෙසේ ද පක්ෂයේ නායකත්වයේ මොළය ක්‍රියාකරන්නේ කෙසේ ද ආදී දහසකුත් එකක් ප්‍රශ්න ඇතිවෙයි.

පංතියට ද්‍රව්‍යවාදීව හෝ භෞතිකවාදීව හෝ ලෝකය පෙරළීමේ, පරිවර්තනයකිරීමේ, අදහස ඇතිවිණි යැයි සිතමු. ඒ අදහස ද්‍රව්‍යවාදී ආකාරයකින් පංතියේ සාමාජික විප්ලවවාදියකුගේ මොළයට යන්නේ කෙසේ ද? පංතියට

© Prof. Nalin De Silva

විද්‍යුත්චුම්බක ක්ෂේත්‍රය වැනි විප්ලවීය ක්ෂේත්‍රයක් තිබේ ද? අල්පෙනෙත්තක් විද්‍යුත්චුම්බක ක්ෂේත්‍රයකට ප්‍රතිචාර දක්වන ආකාරයට ඇතැම් මොළ විප්ලවීය ක්ෂේත්‍රයට ප්‍රතිචාර දක්වන්නේ ද? නායකත්වයට පත්වන පුද්ගලයන්ගේ මොළ විප්ලවීය ක්ෂේත්‍රයෙහි වෙනස් ම ආකාරයකට ක්‍රියාකරන්නේ ද ආදී දහසක් ප්‍රශ්න මෙහි දී ඇසිය හැකි ය.

ද්‍රව්‍යවාදියකු ඇතැම්විට මේ ප්‍රශ්නවලින් ගැලවීම සඳහා වෙනත් මගක් සොයාගනු ඇත. ද්‍රව්‍යවාදියා කියනු ඇත්තේ මනසක් නැති බවත්, ඇත්තේ මොළය ආශ්‍රිත ක්‍රියාකාරකම් පමණක් බවත්, එහෙත් ස්වච්ඡන්දයක් යනුවෙන් ප්‍රපංචයක් පවතින බවත් ය. එහෙත් එය පිළිගත හැකි පිළිතුරක් නො වෙයි. මොළයේ ක්‍රියාකාරීත්වයෙන් ස්වච්ඡන්දයක් යනුවෙන් යමක් ඇති වන්නේ ද? නැත්නම් ස්වච්ඡන්දය යනුවෙන් පැවසෙන්න ද ද්‍රව්‍යවාදීන්ගේ වචන යොදාගන්නේ නම් මිථ්‍යාවක් ද? එවිට ප්‍රශ්නය වනුයේ මිථ්‍යාවක් යනු කුමක් ද යන්න ය.

ස්වච්ඡන්දය යනු හුදෙක් මොළයේ ක්‍රියාකාරීත්වය නිසා ඇතිවන ප්‍රපංචයක් නම් ඒ ප්‍රපංචය ඉන්ද්‍රිය ගෝචර ද? ඒ ප්‍රපංචය දැනෙන්නේ කිනම් ඉන්ද්‍රියකට ද? ද්‍රව්‍යවාදීන්ට මනස යනු ඉන්ද්‍රියක් නොවන බැවින් ස්වච්ඡන්දය යන්න ඔවුන් තේරුම්ගන්නේ කෙසේ ද? ස්වච්ඡන්දය ද මිථ්‍යාවක් යැයි පැවසීම මෙහි දී ද්‍රව්‍යවාදීන්ට දියහැකි හොඳම පිළිතුර වුවත් ඒ සමග වෙනත් ප්‍රශ්න ඇතිවෙයි. ස්වච්ඡන්දය මිථ්‍යාවක් නම් අධිකරණ පද්ධතිය අවලංගුකර දැමිය යුතු ය. කිසිවකු කිසිවකට වගකිවයුතු නොවන බැවින් වරදකරුවා යන සංකල්පය තේරුමක් නැති එකක් බවට පත්වෙයි. ද්‍රව්‍යවාදීන්ට මනසක් නැතැයි සංගත ව කිවහැකි නො වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva